**ශීර්ෂය - 149 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක.

(ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය ශීර්ෂයන් 13 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 552.70 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයකින් තොරව මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාර විධිවිධාන අනුගමනය කර වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුව ඇත. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම, ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් නොමැතිවීම, වර්ෂය මැද භාගයේ රාජ්‍ය අමාත්‍ය ධූරය අහෝසි වීම මත අළුත්වැඩියා අවශ්‍යතා පැන නොනැගීම හා ප්‍රාදේශීය කාර්යාල සඳහා මිලදී ගැනීම් අවශ්‍යතා ඇති නොවීම. |
| (ආ) | වැය විෂයයන් 28 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයන්හි ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 93 ක් දක්වා අතර පරාසයක ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාර විධිවිධාන අනුගමනය කර වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුව ඇත. | 2/2016 චක්‍රලේඛය ප්‍රකාරව දීමනා කොටස් වශයෙන් වැටුපට එකතුවීමෙන් දීමනා ගෙවීම් අඩුවීම, ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් නොමැති වීම, වර්ෂය අග නියෝජ්‍ය ඇමතිවරයෙකු නොසිටීම නිසා වියදම් සීමා වීම, ප්‍රාදේශීය කාර්යාල බොහොමයක් කුලී ගොඩනැගිලි වල පැවතීම හා ප්‍රාදේශීය කාර්යාල වල මිලදී ගැනීම අඩුවීම. |
| (ඇ) | වැය විෂයයන් 09 ක් සඳහා ඉකුත් වර්ෂයට අදාලව බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන 2018 වර්ෂයේ ඇස්තමේන්තුවෙන් සලසා තිබුණද ඒ කෙරෙහි අවධානය යොමු නොකර පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් යටතේ රු. මිලියන 195.42 ක ප්‍රතිපාදන සලසා ගැනීම නිසා, එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ඇස්තමේන්තුවේ සලසා තිබුණු ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමුකර අත්‍යාවශ්‍ය වන්නේ නම් පමණක් පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කළ යුතුව ඇත. | 2017 වර්ෂයේ බැදීම් නිරවුල් කිරීම සඳහා පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණ නමුත් එම ප්‍රතිපාදන ලබාදීමට පෙර 2018 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් එම බැදීම් නිරවුල් කිරීම නිසා බැදීම් නිරවුල් කිරීම වෙනුවෙන් ලබාදුන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකුගේ නොපියවූ රු. 100,208 ක් වූ ණය ශේෂය 2018 දෙසැම්බර් 31 දින වන විට වසර 09 කට වැඩිකාලයක් ඉක්මවා තිබුණද අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය අනුව කටයුතු කළ යුතුව ඇත. | මෙම මුදල අයකරගැනීම සඳහා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවත් එම නිලධාරියා දෙවරක් අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් ඔහුට වරෙන්තු නිකුත් වී ඇති බවත් නඩුව තාවකාලිකව බහා තබා ඇති බව. |
| (ඉ) | අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛණයේ කාර්යාල උපකරණ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වටිනාකම සමඟ නොසැසඳීම නිසා රු. 8,269,591 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් ලේඛණයේ සඳහන් වටිනාකමට මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කරනු ලබන වටිනාකම සමඟ එකඟ විය යුතුය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් තුළ කාර්යාල උපකරණ ගිණුමේ ශේෂය රු.28,624,422 කි. එය 2018 වර්ෂය තුල මිලට ගත් උපකරණ වල වටිනාකම වූ රු.8,269,591 හා 2018.01.01 ට පෙර මිලදී ගන්නා ලද වත්කම් වල තක්සේරු කරන ලද අගය වූ රු. 20,354,851 ක් වූ එකතුවෙන් සමන්විත වේ. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු. 126,750 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 94(1) හි සඳහන් විධිවිධාන වලට පටහැනිව එම ඉතිරිය රු.175,250 කින් ඉක්මවා රු.302,000 ක් වූ බැරකම් වලට එලඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූල වන පරිදි බැරකම්වලට එළඹිය යුතුය. | ඉතා හදිසි අලුත්වැඩියාවක් සඳහා පවත්නා ප්‍රතිපාදනය ඉක්මවා අළුත්වැඩියා කටයුතු සිදුකරගෙන ඇත . |

**2.3 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 කට වැඩි කාලයක් ඉකුත් වූ එකතුව රු. 19,309,393 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය . | පිළිතුරු එවා නැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්තපුර 03 ක ඉදිකිරීමේ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 97.66 ක ප්‍රතිපාදන සලසා තිබුණත් සමාලෝචිත වර්ෂය තුල එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | නිවැරදි ලෙස ව්‍යාපෘති සඳහා වියදම් ඇස්තමේන්තු කිරීම, ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කර සලසා තිබුණු ප්‍රතිපාදන කාලානුරූපීව උපයෝජනය කිරීම සිදුකළ යුතුය. | අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන් හා අදාල සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදයන් නියමිත කාලය තුළ ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි විය. |

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ කර්මාන්තපුර 02 ක ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.මිලියන 11.37 ක් වැයකර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම විධිමත් හා නිවැරදි ලෙස පිළියෙල කළ යුතුය. | කාර්යයන් ඉටුකරගෙන යාමේදී මුහුණ දීමට සිදුවූ අනපේක්ෂිත තත්ත්වයන් මත අමතර වියදම් දැරීමට සිදුවීම. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානෙ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්තපුර 02 ක ව්‍යාපෘතින් 02 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.11 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 28.85 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘති 02 හි කිසිදු භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ඉටුවන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. | එක් ව්‍යාපෘතියකට අදාළ ඇස්තමේන්තුගත මුළු මුදලම ගෙවන තෙක් ව්‍යාපෘතියේ කාර්යන් ඉටුකිරීම ආරම්භ කිරීමට අදාළ ආයතනය කටයුතු නොකිරීම හා අනෙක් ව්‍යාපෘතියෙහි කාර්යයන් පවරන ලද කොන්ත්‍රාත්කරු විසින් අදාළ කාර්යයන් ආරම්භ නොකිරීම නිසා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට සිදුවීම. |

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලැසුම් කර තිබුණු වටිනාකම රු.මිලියන 135.59 ක් වූ ව්‍යාපෘති 09 ක කටයුතු නිම කිරීමට නොහැකිව ප්‍රමාද වී පැවතිණි. එම ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 03 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතීන්ට අදාල ඇස්තමේන්තුගත මුළු මුදලම නොගෙවීම නිසා අදාළ ආයතන කටයුතු ආරම්භ නොකිරීම හා අදාළ ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රමාද වීම මත ව්‍යාපෘතීන් තවදුරටත් ප්‍රමාදව පැවතුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලැසුම් කර තිබූ වටිනාකම රු.මිලියන 29.66 ක් වූ ව්‍යාපෘති 04 ක් නිමකිරීමට නොහැකිව ප්‍රමාද වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය සියයට 45 ක සිට | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රසම්පාදන දැන්වීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රතිචාර නොදැක්වීම මත ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ප්‍රමාදවීම මත හා සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදුවී ඇති ප්‍රමාදයන් නිසා. |

සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.5 ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉක්මවා වියදම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල කර්මාන්තපුර 05 ක ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා රු.21,820,000 ක් වැයකර තිබුණි. | වෙන්කරන ලද ප්‍රතිපාදන සීමාව ඇතුලත වියදම් කිරීමට කටයුතු කළ යුතුය. | කාර්යයන් ඉටුකරගෙන යාමේදී මුහුණ දීමට සිදුවූ අනපේක්ෂිත තත්වයන් මත අමතර වියදම් දැරීමට සිදුවීම. |

**3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කළයුතුව තිබුණද එසේ කටයුතු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කළයුතුය. | 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාව සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර අවසන් කර ඇතත්, දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම සඳහා භාෂා පරිවර්තක වෙත යවා ඇත. එය ලද විගස විගණනය වෙත ඉදිරිපත් කෙරේ. |